දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේඅංකය )
எனது இல ) NA/06/16/2018
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.03. 29.
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල්/ මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීන්,
ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**කුරුණෑගල සහ කෑගල්ල ශික්ෂණ රෝහල් සඳහා ස්ථාන මාරු කැඳවීම - 2018**

ඔබ ආයතනයේ සේවය කරන මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01 හි නම් සඳහන් හෙද නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ගන්නා ලද තීරණ අදාල නිලධාරීන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇත. ඒ අනුව නිර්දේශය සඳහන් තීරුවේ "නිර්දේශ කරමි" යන්න සඳහන් වී ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මින් නියෝග කරමි.

**02.** ඉහත රෝහල් දෙක සඳහා 2019 වසරට අනුමත වූ නිලධාරීන් සංඛ්‍යාව අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සලකා බලා, අංක 01/22/2018 හා 2018.05.11 දිනැති පොදු චක්‍ර ලේඛයේ 02 ඡේදයේ I වන II වන වගන්ති වල හා 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සඳහා ස්ථාන මාරු නියෝග ලබා දීමට කටයුතු කර ඇත.

03. මෙහිදී සේවා කාලය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාළ නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් වලින් බැවින්, එම අයදුම්පත් වල සඳහන් තොරතුරු ව්‍යාජ /අසත්‍ය බව හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කෙරේ. එවැනි තොරතුරු මත ස්ථාන මාරු අයදුම්පත් සහතික කල හා නිර්දේශ කළ නිලධාරීන්ද ඒ සඳහා වගකිව යුතු වේ.

04. අදාල නිලධාරීන් මුදා හැරීමට අවශ්‍ය අනුප්‍රාප්තිකයින් 2014 බී කණ්ඩායමෙන් යොදවා ඇති අතර, ඔවුනගේ නම් මගේ අංක NA/05/67/2019 හා 2019.02.07 දිනැති ලිපිය මඟින් ඔබ වෙත එවා ඇත. අදාල නිලධාරීන් 2019.02.11 දින ඔබ රෝහලේ සේවයට වාර්තා කිරීමට නියමිතව තිබුණි. එම නිලධාරීන් අනුප්‍රාප්තිකයින් ලෙස යොදාගෙන උක්ත ඇමුණුම 01 හි නම් සඳහන් නිලධාරීන් මුදා හැරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධව ඔබ ආයතනයේ අදාල සියලු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

ඒ.එම්.කේ.කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) 02
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

පිටපත්.

**01.** අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල කුරුණෑගල -
**02.** අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල කෑගල්ල -

ඔබ රෝහල් වලට ස්ථාන මාරු මත වාර්තා කිරීමට නියමිත පළාත් රෝහල් වල සේවය කරනු ලබන නිලධාරීන්ගේ නම් ඇමුණුම 02 මඟින් දක්වා ඇත. එම නිලධාරීන් හැර වෙනත් කිසිදු නිලධාරියෙකුට ඔබ රෝහලේ සේවයට වාර්තා කිරීමට ඉඩ නොදෙන මෙන් දන්වමි.